## 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත

## පනතේ අරමුණු

⇨ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම වලක්වාලීම, අනාවරණය කිරීම, විමර්ශනය කිරීම සඳහා පහසුකම් සැපයීම.

⇨ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමට එරෙහි වැරදි සඳහා නඩු පැවරීමට අවශ්‍ය සැක කටයුතු මූල්‍ය ගනුදෙනු පිලිබඳ දත්ත එකතු කිරීම

⇨ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීම මැඩ පැවැත්වීම සඳහා නිසි උද්යෝගී පියවර ගැනීමට ඇතැම් ආයතන වලට නියම කිරීම

⇨ මෙම පනත අදාල වන සියලු ආයතන වල කටයුතු සමීක්ෂණය කිරීම වගකිව යුතු අධිකාරියක් හඳුනා ගැනීමේ විධිවිධාන සැලැස්වීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම.

## මෙම පනත යටතේ පවතින ආයතන වල වගකීම

- මෙම පනත යටතේ " ආයතනයක් " යන්නෙන් යම් මූල්‍ය ව්‍යාපාරයක හෝ මූල්‍ය නොවන ව්‍යාපාරයක නිරතවූ හෝ ඒවා කරගෙන යන යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

- එවැනි ආයතනයක් විසින්, මූල්‍ය බුද්ධි ඒකකය මගින් අදාල පරිදි නිකුත් කරන ලද රීතීන් වලට යටත්ව තම ගනුදෙනුකරුවන්ට අදාල තොරතුරු තහවුරු කර ගැනීම සිදු කල යුතු අවස්ථා 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීම් පනත මගින් දක්වා ඇත.
- සෑම ආයතනයක් විසින්ම තම ව්‍යාපාරික කටයුතු වලට අදාල ගනුදෙනු සටහන් සහ ලිපිගොනු වාර්තා වසර 6 ක කාලයක් දක්වා තම සන්තකයේ තබා ගත යුතු අතර, ඊට වඩා දීර්ඝ කාලයක් ඒවා තම සන්තකයේ තබා ගත යුතු යැයි මූල්‍ය බුද්ධි ඒකකය විසින් විධාන කරන්නේ නම් එම අදාල දීර්ඝ කාලය දක්වා තමා සන්තකයේ තබා ගත යුතුය.
- සෑම ආයතනයක් විසින්ම , මෙම පනත යටතේ යම් වාර්තාවන් පවත්වාගෙන යා යුතු යැයි නියමිත අවස්ථාවක, මූල්‍ය බුද්ධි ඒකකය විසින් හෝ වෙනත් බලය ඇති නියෝජිතායතනයක් විසින් එම වාර්තා වල ඇතුලත් තොරතුරු ඉල්ලා සිටි අවස්ථාවකදී එම ඉල්ලීම වහාම ඉටු කල හැකි වන ආකාරයකට එකී වාර්තාවන් පවත්වා ගෙන යා යුතුය.

## <u>මූල්‍ය බුද්ධි ඒකකය ( Financial Intelligence Unit )( FIU )</u>

- 2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත මගින් මූල්‍ය බුද්ධි ඒකකය හඳුන්වා දෙනු ලැබීය. එහි බලතල සහ කර්තව්‍ය පිලිබඳව පනතේ 15 වන වගන්තියෙහි සඳහන් වේ.
- තවද පහත දැක්වෙන බලතල ඉටුකිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය වාර්තාගත තොරතුරු සඳහා මධ්‍යගත ගබඩාවක් ලෙස ක්‍රියා කරයි.
- ඒවා නම්,

⏭ සියලුම වාර්තා ආයන මගින් මුදල් ගනුදෙනු වාර්තා, ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු සහ සැක සහිත ගනුදෙනු වාර්තා ලබා ගැනිම.

⏭ මූල්‍යමය අපරාධ චෝදනාවකදී පැමිනිලිකාර පක්ෂයට සහාය වීම පිණිස ඒකරාශී කල දත්ත විශ්ලේෂණය

⏭ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැනි ක්‍රියාවන් පිලිබඳ තොරතුරු ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් බෙදා හැරීම.

**ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව පහත සඳහන් ක්‍රියාකාරකම්ද මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදු කරයි.**

- පාරිභෝගිකයා හඳුනා ගැනිම සහ වාර්තා තබා ගැනීම සඳහා මූල්‍යමය සහ අනෙකුත් වාර්තාගත කිරීමේ අංශ වෙත රීති නිකුත් කිරීම.
- මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරනු ලබන මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි රීති සමග මූල්‍ය සහ අනෙකුත් වාර්තාගත කිරීමේ අංශ පවතින අනුකූලභාවය තහවුරු කිරීමට විභාග පැවැත්වීම.
- සියලු සම්බන්ධතා පාර්ශවයන් අතර අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.
- මුදල් විශුද්ධිකරණයේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ප්‍රවනතා විශ්ලේෂණය කරමින් පර්යේෂණ සිදු කිරීම සහ කාර්යක්ෂම වලක්වාගැනීමේ මානයන් වර්ධනය කිරීම සඳහා ක්‍රමෝපායන් සැකසීම.

## මූල්‍ය බුද්ධි ඒකකයේ අරමුණු

- මෙහි ප්‍රධාන අරමුණ වන්නේ අන්තර්ජාතික ප්‍රමිතීන් සහ නිර්දේශයන් සමග සමගාමීව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ ඒ හා සම්බන්ධිත අනෙකුත් අපරාධ වැලැක්වීමයි

- ඒ අනුව මූල්‍ය බුද්ධි ඒකකයේ **( FIU )** අරමුණු පහත පරිදි දැක්විය හැකියි
    - ශ්‍රී ලංකාවේ මිදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම් වලට විරුද්ධව ක්‍රියා කිරීම.
    - ශ්‍රී ලංකාවේ දැනට පවතින මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමට එරෙහි පද්ධතිය වැඩි දියුණු කිරීම.
    - ශ්‍රී ලංකාවේ නියාමන තත්වය ජාත්‍යන්තර තත්වයට උසස් කිරීම.
    - අන්තර්ජාතික සංවිධාන සමග සහයෝගය වැඩි කිරීම සහ මුදල් විශ්ද්ධිකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි යහපත් පරිචයන් / අන්තර්ජාතික නිර්දේශ ක්‍රියාත්මක කිරීම්

**මෙම පනත අනුව අදාල ආයතනයන් විසින් පහත අවස්ථා වලදී මූල්‍ය බුද්ධි ඒකකය වෙත කරුණු වාර්තා කල යුතුය.**

- අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියමයන් මගින් නියම කරනු ලැබිය යුතු යම් මුදලක් ඉක්මවන ප්‍රමාණයක යම් ගනුදෙනුවක් හෝ විදේශ මුදල් වලින් ඊට සමාන මුදලක් පිලිබඳව ගනුදෙනුවක් තවතවත

- මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද රීති මගින් නියම කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් ඇතුලත සිදුවූ ගනුදෙනුකරුවෙකුගේ ඉල්ලීම මත සිදු කෙරෙන යම් විද්‍යුත් අරමුදල් හුවමාරුවක් ත්වත්වත්වග

පිලිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතුය.

- තවද,
- යම් නීති විරෝධී කටයුත්තක් හෝ සාපරාධී වරදක් කිරීමට අදාල විය හැකි යැයි සැක කිරීමට තරම් හේතු ඇති යම් ගනුදෙනුවක් හෝ එබඳු ගනුදෙනුවක් සිදු කිරීමට තැත් කිරීමක්
- ත්‍රස්තවාදී කණ්ඩායම් වල දේපල වලට හෝ පනත යටතේ වූ වැරදි සිදු කිරීම සඳහා යොදා ගනු ලබන බවට සැක කල හැකි දේපල වලට අදාල තොරතුරු පිලිබඳව, එලෙස සැක ඇතිකර ගැනීමෙන් හෝ තොරතුරු ලැබීමෙන් පසුව එතැන් පටන් වැඩකරන දින දෙකක් පසු නොවී මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කල යුතුය.

**සෑම ආයතනයක් විසින්ම, ඒ ආයතනය සමග ගනුදෙනු පවත්වා ගෙන යනු ලබන යම් අයෙකුට අදාලව පහත දැක්වෙන තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වහාම හෙලි කල යුතුය.**

- ත්‍රස්තවාදී ක්‍රියාවලියක් මගින් මගින් ලැබුණු දේපලක් යැයි එහි දැනීම අනුව හෝ හේතු සහිතව සැක කරන දේපලක් එහි සන්තකයේ හෝ පාලනයේ පැවතීම පිලිබඳව
- ත්‍රස්තවාදී ක්‍රියාවලියක් මගින් ලැබුණු දේපලක් සම්බන්ධයෙන් වූ ගනුදෙනුවක් පිලිබඳ යම් තොරතුරක් පිලිබඳව
- යම් ත්‍රස්තවාදී ක්‍රියාවලියක් මගින් ලැබුණු දේපලකට යම් ගනුදෙනුවක් සම්බන්ධ වී ඇතැයි  සැක කිරීමට තරම් සාධාරණ හේතු ඇත්තා වූ ගනුදෙනුවක් හෝ යෝජිත ගනුදෙනුවක් පිලිබඳ යම් තොරතුරක්
- යම් නිශ්චිත ආස්ථිත්‍යයකට අයත් වූ හෝ ඒ වෙනුවෙන් පාලනය කරනු ලබන නැතහොත් නිශ්චිත ආස්ථිත්‍යයක් විසින් හෝ ඒ වෙනුවෙන් අයත් වන්නේ යැයි හෝ පාලනය කරනු ලබන්නේ යැයි සැක කිරීමට තරම් සාධාරණ හේතු ඇත්තාවූ යම් දේපලක් යමෙකුගේ සන්තකයේ හෝ පාලනයේ පැවතීම.

**මූල්‍ය බුද්ධි ඒකකයට පහත කාරණා නිර්දේශ කරමින් රීති පැනවිය හැකිය.**

- යම් විශේෂ ගනුදෙනුකරුවෙකු හෝ ගනුදෙනුකාර පන්තියක් හඳුනාගැනීම් හෝ සත්‍යායනය කිරීම සඳහා අවශ්‍ය නිල හෝ හඳුනාගැනීමේ ලේඛණය හෝ විශ්වාස

කටයුතු හෝ හෝ ස්වාධීන ලේඛණ ප්‍රභව, දත්ත හෝ තොරතුරු නැතහොත් වෙනත් සාක්ෂි පිලිබඳව ත්වත්වත්වත්වග

- 2( 3 ) වගන්තිය යටතේ හඳුනාගැනීමේ සහ සත්‍යායනය කිරීමේ අවශ්‍යතා පිලිබඳ කාලය පිලිබඳව ත්වත්වත්වත්වග
- යම් ආයතනයක ගනුදෙනුකරුවන් විසින් කරගෙන යනු ලබන ගනුදෙනු වලට, මේ වගන්තිය යටතේ විධිවිධාන පිලිබඳ සූදානම හෝ අවස්ථානුගත කරුණු අදාල විය යුතු ආකාරය පිලිබඳව ………………

නියම කරමින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් රීති නිකුත් කල හැකිය.

**2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත මගින් ප්‍රතිපාදන සපයා පාලනය කරනු ලබන අංශ**

- **) මූල්‍ය ව්‍යාපාර ( FINANCIAL BUSINESSES ) – මීට පහත ඒවා අයත්ය.**

🎗 බැංකු ව්‍යාපාර, 🎗 මුදල් සමාගම් පනත යටතේ පවතින මුදල් ව්‍යාපාර,

🎗 පාරිභෝගික ණය - උකස් වගකීමක් ඇතිව හෝ නැතිව ණය දීම හෝ වෙලඳ ගනුදෙනු වලට මුදල් සැපයීම,

🎗 පාරිභෝගික නිශ්පාදන වලට අදාල ගනුදෙනු නොවන මුදල් බදු ගැනීම,

🎗 මුදල් හෝ මුදලේ අගය මාරු කිරිම,

🎗 මුදල් හා ව්‍යවහර මුදල් මාරු කිරීමේ සේවා,

🎗 බැරපත් සංචාරක චෙක් පත් මුදල් ඇණවුම් බැංකු අයිරා හා විද්‍යුත් මුදල් ආදිය නිකුත් කිරීම හා කලමනාකරණය කිරිම,

🎗 මුදල් ඇපවීම් හා වැයකිරීම් නිකුත් කිරීම් හා අහිමි කිරීම්ද ඇතුලත්ව වාණිජ ගනුදෙනු වලට මුදල් සැපයීම

🎗 මුදල් වෙලඳපොල සාධන පත්‍ර වෙලඳාම , විදේශ විනිමය පොලී අනුපාත සහ සුචි සාධන පත්‍ර අනාගත වෙලඳ ද්‍රව්‍ය වෙලඳාම සහ පැවරිය හැකි ඇප ( සුරැකුම්පත් )

🎗 ඇප ප්‍රශ්ණ සහ ඒවාට අදාල මූල්‍ය සේවා සැපයීම

🎗 අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් ව්‍යාපාර

**<u>2006 අංක 6 දරණ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත මගින් ප්‍රතිපාදන සපයා පාලනය කරනු ලබන අංශ</u>**

- **<u>නාමෝද්දිෂ්ට ( නිශ්චය කරගත් ) මූල්‍යමය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් ( DESIGNATED NON –</u>**

## FINANCIAL BUSINESSES AND PERSONS )- මීට පහත ඒවා අයත්ය.

- කැසිනෝ, සූදුගෙවල් හෝ ලොතරැයියක් පවත්වාගෙන යාම, අන්තර්ජාලය මගින් එවැනි යම් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන යම් තැනැත්තෙක්
- නිහ්චල දේපල මිලදී ගැනීම සහ විකිණීමට අදාලව සේවාදායකයන් සමග ගනුදෙනු වල යෙදුණ නිශ්චල දේපල අනුනායෝජිතයින්
- වටිනා ලෝහ සහ ගල්, අඩ මැණික් ගල් ගනුදෙනු
- නීතීඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන් සහ ගණකාධිකාරීවරුන්ගේ ගනුදෙනු

මෙම පනතට අදාල වාර්තා කිරීමේ ආයතන පහත පරිදි වේ.

- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂ බැංකු
- බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- විශේෂිත ලීසිං සමාගම්
- රක්ෂණ සමාගම්
- කොටස් තැරැව්කාර සමාගම්
- කොලඹ කොටස් වෙළඳපොල

- 🎗 සීමාකල වෙළඳුන්
- 🎗 ඒකක භාර කලමනාකරණ සමාගම්
- 🎗 අවසරලත් ප්‍රාථමික වෙළඳුන්
- 🎗 අවසරලත් මුදල් තරැව්කරුවන්
- 🎗 මුදල් හෝ අගය හුවමාරු කිරීමේ සේවා සපයන්නන්
- 🎗 කැසිනෝ
- 🎗 නිශ්චල දේපල අනුනියෝජිතයන්
- 🎗 වටිනා ලෝහ වෙළඳුන්, වටිනා ගල් සහ වටිනා අඩ මැණික් ගල් වෙළඳුන්
- 🎗 නීතීඥවරුන්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන්
- 🎗 ගණකාධිකාරීවරුන්
- 🎗 භාර සහ සමාගම් සේවා සපයන්නන්

## සැක කටයුතු ගනුදෙනු වාර්තා කරන්නන්ට පනත ප්‍රකාරව ඇති ආරක්ෂාව

- ⏭⏭⏭ මුලය ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ සද්භාවයෙන් හෝ පනත යටතේ ඇති නියෝග වලට අනුකූලව හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින් පනවා ඇති රීති හෝ මග පෙන්වීම් යටතේ සැක කටයුතු මූල්‍ය

ගනුදෙනු වාර්තා කරන ඕනෑම පුද්ගලයෙකුට හෝ ආයතනයකට එරෙහිව සිවිල් නඩු කටයුත්තක් හෝ අපරාධ නඩු කටයුත්තක් හෝ විනයානුකූල ක්‍රියාමාර්ග කිසිවක් නොගත යුතුය. ⏮⏮⏮

- **<u>මෙම පනත යටතේ වැරදි කරන්නන්ට අදාල වන දඬුවම්</u>**

- පලමු වරට මෙම පනත යටතේ සිදුකරන වරදක් සඳහා ⇨⇨⇨

- ♬ ♬ ♬ රුපියල් මිලියන එකක් නොඉක්මවන ප්‍රමාණයේ දන්ඩණයක්

- දෙවන වර හෝ ඊට වැඩි ලෙස මෙම පනත යටතේ සිදුකරන වරදක් සඳහා ⇨⇨⇨

- ♬ ♬ ♬ මුල් අවස්ථාවිදී පැනවූ දන්ඩණයෙහි වටිනාකම මෙන් දෙගුණයක දණ්ඩණයක් සමග අතිරේක දඩ මුදලක්

## ග<u>නුදෙනුකරුවන් පිලිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම</u>

## <u>Customer Due Diligence ( CDD )</u>

- මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත මගින් 2018 ඔක්තෝම්බර් මස 08 වන දින අංක 2092/02 දරණ අති

විශේෂ ගැසට් පත්‍රය සහ සංශෝධිත 2016 ජනවාරි 27 වන දින අංක 1951/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රය යටතේ දක්වා ඇති 2016 අංක 1 දරණ මූල්‍ය ආයතන ( ගනුදෙනුකරුවන් පිලිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ ) රීති හරහා ගනුදෙනුකරුවන් පිලිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති පාලනය සහ තොරතුරු ලබා දීම සිදු කරයි.

- එය අනුව සෑම මූල්‍ය ආයතනයක් විසින්ම තම තමන්ගේ ගනුදෙනුකරුවන්ට අදාලව  මුදල් විශුද්ධිකරණය අවදානම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම හඳුනාගැනීමේ තක්සේරු කිරීමේ සහ කලමනාකරණය කිරීමේ සුදුසු පියවර ගත යුතුයි
- සෑම ආයතනයක් විසින්ම ව්‍යාපාරික සම්බන්ධතාවයන්ට එලඹීමට පෙර සිය ගනුදෙනුකරුවන් හඳුනා ගත යුතුයි
- ඒ අනුව පහත සඳහන් තොරතුරු ලබා ගැනීම සහ තහවුරු කර ගැනීම කල යුතුයි
- හඳුනාගැනීමේ ලේඛණයේ සඳහන් පරිදි සම්පූර්ණ නම
- ගනුදෙනුකරුගේ ඡායාරූපය ඇතුලත් වන නිල පෞද්ගලික හැඳුනුම්පත හෝ වෙනත් එබඳු ලේඛණයක් ( ජා.හැ.පත,රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය )
- ස්ථිර ලිපිනය
- දුරකථන අංකය, විද්‍යුත් ලිපිනය ආදිය ( තිබේ නම් )

- උපන් දිනය
- ජාතිය
- රැකියාව, ව්‍යාපාරය, තනතුර, සේවායෝජකයාගේ නම සහ අදාල වන භූගෝලීය පසුබිම
- ගිණුම ආරම්භ කරන කාරණය
- අපේක්ෂිත ව්‍යාපාර පිරිවැටුම, ව්‍යාපාර ධාරිතාවය
- ගනුදෙනු කිරීමට අපේක්ෂිත ආකාරය

**<u>නිසි උද්‍යෝගය අනුගමනය කිරීම සදහා අවම වශයෙන් පහත තොරතුරු ලබා ගත යුතුය.</u>**

- ගිණුම ඇරඹීමේ හේතුව
- ඉපයීම් වල මූලාශ්‍ර
- අපේක්ෂිත මාසික පිරිවැටුම / ආදායම
- අපේක්ෂිත ගනුදෙනු මාධ්‍ය ( උදා - මුදල් / චෙක්පත් වැනි )
- ප්‍රතිපාර්ශව වල අපේක්ෂිත ප්‍රභේද ( අදාල වේ නම් )

## අනෙකුත් රටවල් සමග පවතින අවබෝධතා ගිවිසුම්

- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම ගෝලීය වශයෙන් සිදු වන සංසිද්ධියකි. එම ක්‍රියාමාර්ග මැඩ පැවැත්වීම ලොව කිසිඳු රටකට තනි තනිව සිදු කල නොහැක.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ගෝලීය ව්‍යායාමයට සහාය දෙමින් විවිධ කණ්ඩායම් සහ බලකායන් ආරම්භ කර ඇත,
- මූල්‍ය කටයුතු පිලිබඳ කාර්ය බලකාය ( Financial Action Task Force / FATF )
- එග්මොන්ට් කණ්ඩායම ( The Egmont Group )
- මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් වන ආසියා පැසිෆික් හවුල ( Asia Pasific Group on Money Laundering / APG )